# ජනාධිපතිවරණය - 2019

# දෙවන මාධ්‍ය වාර්තාව - 2019.11.07

## තැපැල් ඡන්දය සාමකාමී යි.

මෙවර ජනාධිපතිවරණයට අදාළව තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලුම්පත් 717918 ක් යොමුකර තිබුණ ද නිසි පරිදි අයදුම්පත් යොමු නොකිරීම හේතුවෙන් 58601ක පිරිසකගේ ඡන්දය ප්‍රතික්ෂේප වූ අතර, 659306 ක ප්‍රමාණයක් තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලැබීය.

2019 ඔක්තෝබර් 31 සිට නොවැම්බර් 01,04,05, යන දිනවලදී දිවයින පුරා විසිරී ඇති මධ්‍යස්ථාන 7920 කදී තැපැල් ඡන්ද සළකුණු කිරීම සිදු විය. එමෙන්ම එම දිනවලදී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ පිරිසට 7 වන දින ඡන්දය භාවිත කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

පැෆ්රල් සංවිධානය තැපැල් ඡන්ද නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂකයින් දහසක පිරිසක් සැලකිය යුතු ඡන්ද ප්‍රමාණයක් සහ දේශපාලන වශයෙන් සංවේදී භාවයක් සහිත ඡන්ද මධ්‍යස්ථාන සඳහා යොදවන ලදි.

ඡන්ද දායකයින් ප්‍රවාහනය කිරීම, අපේක්ෂකයින්ගේ රුව සහිත කුඩා පත්‍රිකා ඡන්ද මධ්‍යස්ථානය අවට විසුරුවා හැරීම, අනන්‍යතා ලේඛනවලට අයත් නොවන රාජකාරී හැඳුනුම්පත් රැගෙන ඡන්දය භාවිත කිරීම, සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් මුහුණුපොත හරහා සමාජගත කිරීම වැනි සිදුවීම් කිහිපයක් හැරුණු කොට බරපතල ගණයේ සිදුවීම් තැපැල් ඡන්ද දිනවලදී අප වෙත වාර්තා නොවීය.

එහෙත් තැපැල් ඡන්ද අයදුම්පත් 58601 ක් ප්‍රතික්ෂේප වීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු විය යුතුය. මෙයින් සමහර අයදුම්පත් හරියාකාරව සම්පූර්ණ කිරීමට නොදැනීමත්, සමහර අයදුම්පත් නියමිත දිනට නොලැබීමත් හේතුවෙන් ප්‍රතික්ෂේප වූ බව වාර්තා විය. එහෙත් ඒ අතර ආයතන ප්‍රධානියාගේ නොසැළකිලිමත්භාවය නිසා තැපැල් ඡන්ද අහිමි වූ පිරිසක් සිටින බව ද නිරීක්ෂණය වේ. එබැවින් එසේ නොසැලකිලිමත් ආකාරයට කටයුතු කළ නිලධාරීන් පිළිබඳව විධිමත් පරීක්ෂණ සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමුවිය යුතුය.

## රාජ්‍ය දේපළ හා බලය අවභාවිතා කිරීම

රාජ්‍ය බලය හා රාජ්‍ය දේපළ භාවිත කරමින් අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම මෙම මැතිවරණයේදී ද කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත. මැතිවරණය ප්‍රකාශයට පත් කළ දින සිට මේ දක්වා කාලය තුළ රාජ්‍ය දේපල බලය භාවිත කිරීමේ සිද්ධීන් 130 ක් වාර්තා වී ඇති අතර ඉන් සිදුවීම් 69 ක් තහවුරු වූ සිද්ධීන් වේ. මීට අමතරව රජයෙන් ලබාදෙන සහනාධාර, දේශපාලන අර්ථයෙන් ලබාදීමේ සිදුවීම් 39 වර්තා වී ඇති අතර ඉන් 27 ක් තහවුරු වී ඇත. 2015 ජනාධිපතිවරණයට සාපේක්ෂව රාජ්‍ය දේපළ හා බලය අවභාවිතාවේ තරමක අඩුවක් පෙන්නුම් කරන අතර විශේෂත්වය වන්නේ 2015 වසරේදී එම චෝදනාව එල්ලවූයේ එක් දේශපාලන කණ්ඩායමකට වුවද මෙවර එය දේශපාලන කඳවුරු 2 අතරේම බෙදී යයි. එහෙත් එහි ප්‍රමුඛ හා බරපතල චෝදනා මධ්‍යම ආණ්ඩුව වෙත එල්ල වේ.

| රාජ්‍ය බලය දේපළ නිළධාරින් අයුතු ලෙස භාවිතයට අදාළ නිති උල්ලංඝනයන් 2015 -2019 සංසන්දනාත්මකව | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පැමිණිලි | | තහවුරු කළ | | තහවුරු නොකළ | |
| **සිදුවීම්වල ස්වභාවය** | 2015 | 2019 | 2015 | 2019 | 2015 | 2019 |
| රාජ්‍ය දේපළ අයුතු ලෙස භාවිතය | 46 | 23 | 37 | 18 | 9 | 5 |
| රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා භාවිතා කිරීම | 36 | 24 | 32 | 11 | 4 | 13 |
| රාජ්‍ය නිළධාරින්ට බලපෑම් කිරීම | 20 | 2 | 19 | 1 | 1 | 1 |
| රාජ්‍ය නිළධාරින් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම | 41 | 54 | 32 | 24 | 9 | 30 |
| රාජ්‍ය නිළධාරින් හා ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම | 51 | 27 | 36 | 15 | 15 | 12 |
| | | | | | | |

මෙම සංසන්දනයේදී 2015 ජනාධිපතිවරණයට අදාලව දක්වන සමස්ත පැමිණිලි පූර්ව මැතිවරණ කාලසීමාවට අදාළ වන අතර 2019 නාම යෝජනා භාරදීමේ සිට මේ දක්වා (නොවැ.07) කාලය පමණක් අදාළ වේ.

## රාජ්‍ය බලය අවභාවිතාව පිළිබඳව චෝදනා එල්ල වී ඇති ආකාරය

රජයේ අමාත්‍යාංශ - 24

පළාත් පාලන ආයතන - 23

ආණ්ඩුකාරවරු - 6

පළාත් පාලන ආයතනවල සම්පත් අවභාවිතයට අදාළ පැමිණිලි වලින් බහුතරය එනම් පැමිණිලි 18 පොදුජන පෙරමුණට එරෙහි වන අතර පැමිණිලි 4 එක්සත් ජාතික පක්ෂයට අදාළ වේ.

මෙම කාලය තුළ නීති විරෝධී පත් කිරීම් සම්බන්ධ පැමිණිලි 34 ක් වාර්තා වී ඇති අතර මාරු කිරීම්වලට අදාළ පැමිණිලි 13 සහ උසස් කිරීම්වලට අදාළ පැමිණිලි 05 ක් වාර්තා වී ඇත. මෙයින් අදහස් කරන්නේ පැමිණිලි ප්‍රමාණය වන අතර එක පැමිණිල්ලක් තුළ පත්වීම් දහස් ගණනක් අඩංගු වන අවස්ථා ද ඇත. අනෙකුත් පැමිණිලි ද ඒ ආකාරයට වේ. එමෙන්ම මෙම චෝදනා මධ්‍යම ආණ්ඩුවට මෙන්ම පළාත් සභාවලට ද එල්ල වේ.

## මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල තරමක වැඩි වීමක්


පසුගිය දින කිහිපය තුළ පක්ෂ කාර්යාලවලට හානි කිරීම්, පුද්ගල පහරදීම්වලට අදාළ සිදුවීම්වල වර්ධනයක් පෙන්නුම් කළ ද 2015 ට සාපේක්ෂව මෙවර ප්‍රචණ්ඩකාරී සිදුවීම්වල අඩුවක් දැකිය හැකිය. එසේ වුවත් මෙවර වාර්තාවූ ප්‍රචණ්ඩ ක්‍රියා 36 න් 29 ක් තහවුරු වී ඇති නමුත් වෙඩි තැබීම්, බෝම්බ ප්‍රහාර හෝ ඝාතන කිසිවක් වාර්තා නොවීම ඉතා සාධනීය තත්ත්වයකි.

| සිදුවීම්වල ස්වභාවය | බරපතල ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට අදාළ නිති උල්ලංඝනයන් 2015-2019 හා සංසන්දනාත්මකව | | | | | |
|---|---|---|---|---|---|---|
| | පැමිණිලි | | තහවුරු කළ | | තහවුරු නොකළ | |
| | 2015 | 2019 | 2015 | 2019 | 2015 | 2019 |
| බරපතල ගණයේ පහර දීම් | 36 | 9 | 36 | 8 | 0 | 1 |
| පහර දීම් | 21 | 12 | 21 | 10 | 0 | 2 |
| පැහැරගෙන යාම් | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| බෝම්බ ප්‍රහාර | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| වෙඩි තැබීම් | 10 | 0 | 10 | 0 | 0 | 0 |
| ගිනි අවි භාවිත කර තර්ජනය කිරීම | | 1 | 1 | 0 | 0 | 0 |
| බිය වැද්දවීම | 8 | 5 | 8 | 4 | 0 | 1 |
| නිශ්චල දේපල වලට හානි කිරීම | 18 | 2 | 15 | 2 | 3 | 2 |
| චංචල දේපල වලට හානි කිරීම | 17 | 1 | 15 | 1 | 2 | 0 |
| තර්ජනය කිරීම හා බිය වැද්දීම | 36 | 5 | 32 | 4 | 4 | 1 |
| දේශපාලන පක්ෂ කාර්යාලවලට හානි කිරීම් හා ගිනිබත් කිරීම් | 42 | 11 | 41 | 9 | 1 | 2 |
| | | | | | | |

සාමාන්‍යයෙන් මැතිවරණයකදී වැඩිපුර ප්‍රහාරයන්ට ලක්වන්නේ විපක්ෂය වුවද මෙම මැතිවරණයේදී වැඩිපුර ප්‍රහාරයට ලක්වී ඇත්තේ පාලක පක්ෂය යි. එය පහත උදාහරණයෙන් පැහැදිලි වේ.


**2019 10 17 දින සිට 2019 11 05 දක්වා වාර්ථා වී ඇති ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට අනුව පීඩාවට පත්වූ දේශපාලන පක්ෂ**

| පීඩාවට පත්වූ පක්ෂය | සිද්ධීන් ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 15 | 42.9 % |
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 7 | 20 % |
| ජාතික ජන බලවේගය | 0 | 0 % |
| ස්වාධීන කණ්ඩායම (සිවාජිලිංගම්) | 1 | 2.8 % |
| නිශ්චිත නොවන | 12 | 34.3 % |
| එකතුව | 35 | 100% |




## 2019 10 17 දින සිට 2019 11 05 දක්වා වාර්ථා වී ඇති ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට අදාලව චෝදනාවට ලක්වූ දේශපාලන පක්ෂ


| චෝදනාවට ලක්වූ පක්ෂය | සිද්ධීන් ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 3 | 8.6 % |
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 4 | 11.4 % |
| ජාතික ජන බලවේගය | 1 | 2.9% |
| නිශ්චිත නොවන | 27 | 77.1 % |
| එකතුව | 35 | 100 % |




## 2019 09 20 දින සිට 2019 11 05 දින දක්වා වාර්තා වී ඇති බරපතල සිද්ධීන්ට අදාලව දිස්ත්‍රික් වශයෙන් වාර්තා වී ඇති රෝහල් ගත කිරීම්



සමස්ත පැමිණිලි ප්‍රමාණය දිස්ත්‍රික්ක අනුව




## මාධ්‍ය හැසිරීම

පැෆ්රල් සංවිධානය මාධ්‍ය හැසිරීම විධිමත් ලෙස නිරීක්ෂණය නොකළ ද, මෙවර මැතිවරණයේ මේ දක්වා කාලය තුළ රූපවාහිනී මාධ්‍ය හැසිරීම පිළිබඳ බරපතල විවේචනයක් සමාජය තුළ ගොඩනැගී ඇති බව නිරීක්ෂණය වේ. මැතිවරණ කොමිසම අවස්ථා ගණනාවකදී මාධ්‍ය උපමාන නිකුත් කළ ද මාධ්‍ය ආයතන ප්‍රධානීන් රැස්කර මේ පිළිබඳව දැනුවත් කළ ද එම උපදෙස් උපමාන පිළිගනු ලබන බවක් නොපෙනේ. අවම වශයෙන් රාජ්‍ය මාධ්‍ය හෝ මාධ්‍ය උපමාන අනුව කටයුතු කිරීමට උත්සාහ කරන බවක් නොපෙනේ. මහජනයාට හිමි සංඛ්‍යාත භාවිත කරන මෙම ආයතන සියල්ලම මහජනතාවට නිවැරදි තොරතුරු ගෙන යාමට බැඳී ඇති බව අපගේ නිගමනය වන අතර ඒ අනුව පෞද්ගලික චේවා, රාජ්‍ය චේවා මැතිවරණ කාලය තුළ මැතිවරණ කොමිසමේ උපමානයන්ට අනුකූල විය යුතුය. මෙවර මැතිවරණයේදී සමහර රූපවාහිනී නාලිකාවල ක්‍රියාකාරීත්ව ඉතාම කණගාටුදායක ය. මේ පිළිබඳව අප විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවට සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට ද ලිඛිතව කරුණු දැක්වූ අතර රාජ්‍ය මාධ්‍යයට එරෙහිව මැතිවරණ කොමිසම උපදෙස් දෙන්නේ නම් නීති මඟින් ක්‍රියා කළ හැකි බව අප වෙත දන්වා එවා ඇත. එමෙන්ම රූපවාහිනී පනත හා 2019 සැප්තැම්බර් 09 අංක 2140/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව විෂය භාර අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයාට ඇති නියාමන වගකීම අනුව පෞද්ගලික මාධ්‍ය වලට ද මැතිවරණ කොමිසමේ උපමාන අනුව කටයුතු කිරීමට නියෝග කරන ලෙස අප ගරු ජනාධිපතිවරයාගෙන් ද ඉල්ලා සිටියෙමු. අවම සදාචාර සීමාව හෝ නොසලකා කටයුතු කරන මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් කටයුතු කිරීමට මැතිවරණ කොමිසමට බලය ලැබෙන ආකාරයේ නීති වහා සම්මත විය යුතු බව අප විශ්වාස කරමු. එමෙන්ම නිරීක්ෂණ සංවිධානයක් ලෙස සියලුමරාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටින්නේ මාධ්‍ය ආචාර ධර්ම ආරක්ෂා කරමින් ජනතාවට නිවැරදි තොරතුරු ගෙනයාමේ මූලික වගකීම ඉටු කරන ලෙසය. එසේ නොවුන හොත් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආයතනයන් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වනු ඇත. ඒ වෙනුවට විකල්ප මාධ්‍ය කරා යොමුවීමේ අවධානමක් ද ඇත.

## සමාජ මාධ්‍ය නිරීක්ෂණය

පැෆ්රල් සංවිධානය පළමු වතාවට සමාජ මාධ්‍ය නිරීක්ෂණය මෙවර ජනාධිපතිවරණයෙන් ආරම්භ කළ අතර ඒ සඳහා කණ්ඩායම් දෙකක් පැය 24 ක් පුරාවටම ක්‍රියාත්මක වේ. ඒ හරහා අපේක්ෂකයන්ගේ සමාජ පිටු, දේශපාලන පක්ෂවල හා වැඩි ප්‍රමාණයක් පරිශීලනය කරන පිටු 11000 කට වැඩි ප්‍රමාණයක් අපගේ නිරීක්ෂණයට ලක්විය. එක් කණ්ඩායමක් තාක්ෂණිකව මෙවා පරීක්ෂා කරන අතර, තවත් කණ්ඩායමක් එසේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව තෝරාගත් පිටු පිරික්ෂාවට ලක් කරනු ලබයි. එහිදී, වෛරී ප්‍රකාශ, වැරදි තොරතුරු, නිවැරදි තොරතුරු, වැරදි සහගත ලෙස අර්ථ නිරූපනය ජාති, ආගම් ඉලක්ක කරගත් ප්‍රවෘත්ති හෝ මැතිවරණ නීති උල්ලංඝණය වන ආකාරයේ ප්‍රකාශ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවා දෛනිකව නීතිඥවරයෙකුගේ අධීක්ෂණයෙන් අනතුරුව මැතිවරණ කොමිෂම වෙත යවනු ලැබේ. මැතිවරණ කොමිෂමේ නිරීක්ෂණයෙන් අනතුරුව ඒ මොහොතේම ඒවා Face book ආයතන වෙත යොමු කෙරේ.

**මේ දක්වා අප වෙත වාර්තා වූ පැමිණිලි**



## මැතිවරණ කොමිසම සහ පොලීසිය

මෙවර මැතිවරණයේ මේ දක්වා කාලය තුළ රාජ්‍ය බලය හා දේපළ අවභාවිතය හා මාධ්‍ය සම්බන්ධයෙන් කරුණු හැර සෙසු බොහෝ කරුණු යහපත්ව හසුරුවා ගන්නට මැතිවරණ කොමිසම සමත් වී තිබේ. ප්‍රචණ්ඩත්වය අවම මට්ටමක පවත්වා ගන්නටත්, නීති විරෝධී ප්‍රචාරණ කටයුතු අවම මට්ටමක පවත්වා ගන්නටත් විශේෂයෙන්ම පෝස්ටර්, කටවුට් අවම මට්ටමක පවත්වා ගන්නටත් සමත් වී තිබේ. එය දියුණු දේශපාලන ලක්ෂණයකි. එහි ගෞරවය මැතිවරණ කොමිසම, පොලීසිය, දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධානවලට ද හිමිවිය යුතුය. විශේෂයෙන්ම දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක සහකාර, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන්ට ද වැඩ බලන පොලිස්පති වරයාගේ සිට පහළ නිලධාරීන් දක්වා ද එකී ගෞරවය හිමි වේ.

## පොලීසියට පරීක්ෂණ සඳහා වීඩියෝ ගත කිරීමේ පහසුකම්

පැෆ්රල් හා සී.එම්.ඊ.වී. ආයතන දෙක ඒකාබද්ධව මෙවර මැතිවරණ පැමිණිලි විමර්ශනය කරනු ලබන කණ්ඩායම්වල පහසුව සඳහා කැමරා උපකරණ 71 ක් සහ ජැකට් 285 ක් පොලිස් මැතිවරණ අංශයට භාරදෙනු ලැබීය. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම අවම කිරීමටත්, පරීක්ෂණවලදී විධිමත් සාක්ෂි රැස් කිරීමත් වන අතර එය මේ මැතිවරණයට එකතු වූ විශේෂ අංගයකි.

## ඡන්ද දායකයන් දැනුවත් කිරීමට පියවර රැසක්

ජනාධිපතිවරණයේදී ඡන්දය භාවිත කිරීමට අවශ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම, විශේෂ අවශ්‍යතා සහිත පිරිස සඳහා ලබාගත හැකි පහසුකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පැෆ්රල් සංවිධානය පුවත්පත් දැන්වීම්, රූපවාහිනී, ගුවන්විදුලි දැන්වීම් සහ ප්‍රථම වතාවට සමාජ මාධ්‍ය ඔස්සේ ද පුළුල් පරාසයක දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් මේ වන විට අරඹා ඇත.

එමෙන්ම හැඳුනුම්පත් නොමැති ඡන්ද දායකයන්ට තාවකාලික හැඳුනුම්පත් ලබාගැනීමේ පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය ද අප ප්‍රදේශ දෙකකදී මේ වන විට ක්‍රියාත්මක කරමින් සිටිමු.

මෙවර ජනාධිපතිවරණ සඳහා 2018 ඡන්ද හිමි නාමලේඛනය භාවිත කරන අතර ඡන්ද දායකයන් ප්‍රමාණය 15,992,096 ක් ඡන්ද මධ්‍යස්ථාන 12845 කදී ඡන්දය භාවිතා කිරීමට නියමිතය.

## පැෆ්රල් සූදානම

මෙම කටයුතු නිරීක්ෂණය සඳහා පැෆ්රල් සංවිධානයෙන් 5000 ක පිරිසක්

1. දිගුකාලීන නිරීක්ෂකයින් 141
2. දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 31
3. ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 30
4. දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථානය සඳහා 23
5. තැපැල් ඡන්ද නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයින් 1000
6. ස්ථානගත නිරීක්ෂකයින් 3000
7. ජංගම නිරීක්ෂණ රථ 225 නිරීක්ෂකයින් 1000
8. සමාජ මාධ්‍ය නිරීක්ෂණ කණ්ඩායම් 02
9. පැමිණිලි කළමනාකරණ කණ්ඩායම් 02
10. ගණන් කිරීමේ කටයුතු සඳහා 150 ක්